# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2237/41 - 2021 ජූලි මස 25 වැනි ඉරිදා - 2021.07.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක 82

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(අ) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(අ) වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කරමින්, කිසිදු ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායුව (Liquefied Petroleum Gas) (LPG) අඩංගු ගෘහස්ථ ගෑස් සිලින්ඩර නිෂ්පාදකයෙකු, බෙදාහරින්නෙකු, අලෙවි නියෝජිතයෙකු හෝ වෙළෙන්දෙකු විසින් අදාළ ගෘහස්ථ ගෑස් සිලින්ඩරවල බර කිලෝ ග්‍රෑම්වලින් අදාළ සිලින්ඩරවල ප්‍රකටව පෙනෙන ස්ථානයක සඳහන් කර ඇත්තේ නම් මිස, ගෘහස්ථ ගෑස් සිලින්ඩර නිෂ්පාදනය, ගබඩා කිරීම, බෙදාහැරීම හෝ තොග හෝ සිල්ලර වශයෙන් විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

මෙම විධානය වර්ෂ 2021 ජූලි මස 25 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

මේජර් ජෙනරාල් ශාන්ත දිසානායක (විශ්‍රාමික),
සභාපති.

2021 ජූලි මස 25 වැනි දින,
කොළඹ දී ය.

1A - PG 5416 — 120 (2021/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*